පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) පැරණි නිර්දේශය - 2017 දෙසැම්බර්

සමාජවිද්‍යාව

සමාජවිද්‍යාවේ න්‍යාය හා ක්‍රමවේද - SSG 1

(කාලය පැය 03 යි)

එක් කොටසකින් ප්‍රශ්න 2ක් බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

(මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි -

(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ)

## පළමු කොටස

1. සමාජවිද්‍යාව යනු කුමක් ද? සමාජවිද්‍යාව විෂයක් ලෙස ආරම්භ වීමට බලපෑ ඓතිහාසික සිද්ධීන් සාකච්ඡා කරන්න.

2. "කාර්ල් මාර්ක්ස්ගෙන් සමාජ විද්‍යාවට සිදුවූ දායකත්වය" යන මැයෙන් රචනාවක් ලියන්න.

3. පහත දැක්වෙන කරුණු පිළිබඳව මැක්ස් වෙබර් සහ එමිල් දුර්කයිම්ගේ න්‍යායාත්මක මතවාද පිළිබඳ සන්සන්දනය කරන්න.
   1. සමාජ සංසිද්ධීන්වල ස්වභාවය
   2. සමාජ විද්‍යාත්මක ක්‍රමය

4. ඔබ දන්නා සමාජ මානවවිද්‍යාවේ හා සමාජවිද්‍යාවේ පුරෝගාමී කෘත්‍යවාදීන් දෙදෙනෙකුගේ අදහස් පිළිබඳව සන්සන්දනාත්මක විග්‍රහයක් කරන්න.

## දෙවන කොටස

5. "සමාජ පර්යේෂණවල දී ආචාරධර්ම ප්‍රඥප්තීන් කිසිම ආකාරයකින් නොකැඩිය යුතුය" මෙම ප්‍රකාශනය නිදසුන් සහිතව විභාග කරන්න.

6. කොළඹ මහ නගර සීමාව තුළ ඝන අපද්‍රව්‍ය ගැටළුව අවම කිරීම සඳහා සුදුසු පර්යේෂණ සැළැස්මක් සකස් කරන්න.

7. සමාජ පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස සහභාගී නිරීක්ෂණයේ හා අභිමුඛ අර්ධ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවල ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න.

8. ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමය සමාජවිද්‍යා පර්යේෂණවල දී කෙතෙක් දුරට ප්‍රයෝජනවත් වේ ද? නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) පැරණි නිර්දේශය - 2017 දෙසැම්බර්

සමාජවිද්‍යාව

ව්‍යාවහාරික සමාජවිද්‍යාව - SSG II

(කාලය පැය 03 යි)

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

(මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි -

(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ)

1. ව්‍යවහාරික සමාජවිද්‍යාව යනු කුමක් දැ යි පැහැදිලි කොට එහි විෂය පථය විස්තර කරන්න.

2. ශ්‍රී ලංකාව තුළ රජයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන සෞඛ්‍ය සුභසාධන සේවාව විවේචනාත්මකව විභාග කරන්න.

3. ග්‍රාමීය සංවර්ධනයේ දී ප්‍රජා මූල සංවිධානවල කාර්යභාරය විස්තර කරන්න.

4. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වන හේතු හඳුනා නොගත් වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

5. ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මුහුණදෙන ගැටළු පිළිබඳ රචනයක් ලියන්න.

6. මොරගහ කන්ද බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක් කරන්න.

7. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වන ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා අනුගමනය කළ හැකි උපායමාර්ග පිළිබඳ විස්තර කරන්න.

8. පහත සඳහන් ඕනෑම **තුනක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න

   අ. ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශවල දුගී බව.

   ආ. ශ්‍රී ලංකාවේ සිදුවන සියදිවි නසා ගැනීම්.

   ඇ. ශ්‍රී ලංකවේ නාගරික පරිසර දූෂණය.

   ඈ. නූතන ශ්‍රී ලංකාවේ අපරාධ රැල්ල.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) පැරණි නිර්දේශය - 2017 දෙසැම්බර්

සමාජවිද්‍යාව

# දකුණු ආසියාව පිළිබඳ සමාජ විද්‍යාව - SSG III

(කාලය පැය 03 යි)

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

(මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි)

(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ)

1. දකුණු ආසියාව සංස්කෘතික කළාපයක් වන්නේ කුමන අරුතකින් ද?

2. දකුණු ආසියාවේ ග්‍රාමීය සමාජ සන්දර්භය තේරුම් ගැනීම සඳහා රොබට් රෙඩ්ෆීල්ඩ්ගේ ගැමි සමාජ පිළිබඳ න්‍යායාත්මක එළඹුම භාවිතා කළ හැක්කේ කෙසේ ද යි පැහැදිලි කරන්න.

3. දකුණු ආසියාවේ සමාජ ව්‍යාපාර වලින් එකක් තෝරාගෙන සමාජ වෙනස සඳහා එහි ඇති දායකත්වය සාකච්ඡා කරන්න.

4. "ඥාතීත්වය දකුණු ආසියානු සමාජවල දේශපාලනයේ දී සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරයි" සාකච්ඡා කරන්න.

5. ගෝලීයකරණය මඟින් ඇතැම් සංස්කෘතික අනන්‍යතා දුබල කෙරෙන අතර තවත් සංස්කෘතික අනන්‍යතා සවිමත් කරනු ලැබේ. දකුණු ආසියාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

6. නූතන ශ්‍රී ලංකා සමාජය තුළ ජනප්‍රිය ආගමික ඇදහිලි ඉස්මතු වීම ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

7. "අසංවිධිත නාගරීකරණය දකුණු ආසියාවේ නගරවල විශාල පාරිසරික ගැටළු ඇති වීම සඳහා බලපා ඇත" මෙම කියමන සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

8. පහත දැක්වෙන මාතෘකා වලින් **තුනක්** පිළිබඳ සටහන් ලියන්න

    1. සංස්කෘතකරණය
    2. මැක්ස් වෙබර් හා ඉන්දියානු සමාජය
    3. මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය
    4. වාරිකර්ම සමාජය
    5. ජජ්මාන් ක්‍රමය
    6. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය